# 01 බුදුබව පතන මහබෝසතාණෝ

දුල්ලභඤ්ච මනුස්සත්තං - බුද්ධුප්පාදො ච දුල්ලභො
දුල්ලභා ඛණ සම්පත්ති - සද්ධම්මො පරම දුල්ලභො

මෙලොව ඉතා දුර්ලභ කාරණා සතරක් තිබෙනවා. මිනිසෙකු වී ඉපදීම දුර්ලභ ය. බුදුරජාණන් වහන්සේ ගේ පහළ වීම දුර්ලභ ය. ක්ෂණ සම්පත්තිය හෙවත් පින්දහම් කරගත හැකි තැනක පිනක් දහමක් කරගත හැකි කෙනෙකු විදියට ඉපදීම දුර්ලභ ය. මේ හැම දේටමත් වඩා සද්ධර්මය ඉතා ම දුර්ලභ ය.

අද අපට මේ දුර්ලභ කාරණා සතර ම ලැබී තිබේ. අප මේ සියලු විපත්වලින් මිදී සිටින ඉතා ම වාසනාවන්ත පිරිසක්. එසේ තිබිය දී මහණ වෙන්නත් ලැබීම, කියා නිම කරන්නට බැරි තරම් වාසනාවක්.

මේ සියලු දේවල් අතරින් අගනා ම සම්පත්තිය නම් මෙය බුද්ධෝත්පාද කාලයක් වීම ය.

" බුදු කෙනෙකුන් මේ ලොව නූපන් වර
අඳුරෙක් ම ය සදහම් නැති මේ සසර
ඉඳුරා නො දැනෙයි පව් පින් තොරතුර
සිදු නො කළැකි ඉන් සග මොක් සිරිසර "

-ලෝවැඩ සඟරාව-

ඒ උතුම් වූ බුදුරජාණන් වහන්සේගේ පහළ වීමේ පුවත යි අප මේ කියන්නට සැරසෙන්නේ.

### පළමු විවරණ ලැබීම

අප මහා බෝසතාණන් වහන්සේ මීට අසංඛ්‍ය කල්ප ලක්ෂ හතරකට පෙර දඹදිව අමරවතී නුවර ධනවත් බමුණු පවුලක එක ම පුත්‍රයා වී උපන්නා.

එතුමාගේ නම සුමේධ. මෙතුමා බමුණෙකු ඉගෙන ගත යුතු ත්‍රිවේදයේ ම පරතෙරට ගිය කෙනෙක්. එහෙත් එතුමාට කම් සැප ගැන ආශාවක් තිබුණේ නැත. මව්පියන් මිය පරලොව ගිය පසු තමාට හිමි වූ කෝටිගණන් ධනය දුගී මගී යාචකයන්ට දන් දී තවුස් පැවිද්දෙන් පැවිදි විය. බණ භාවනා කළ එතුමා ධ්‍යාන වඩා ඍද්ධිබල සම්පන්න තාපසයෙක් බවට පත් විය.



මේ කාලයේ දීපංකර සම්බුදුපියාණන් වහන්සේ ලොව පහළ වී වැඩ සිටි සේක. මෙම නගරයේ මිනිස්සු උන්වහන්සේට දනට ආරාධනා කොට වඩින මග සරසන්නට පටන් ගත්හ. එතැනින් අහසින් යන සුමේධ තාපස තුමා එය දැක බිමට බැස මිනිසුන්ගෙන් කරුණු විමසී ය. බුදුරජාණන් වහන්සේ වඩින නිසා මග සරසන බව මිනිස්සු කීහ. "බුදු" යන නම ඇසූ පමණින් තාපසතුමා තුළ මහත් ශ්‍රද්ධාවක් ඇති විය. එතුමාත් දීපංකර සම්බුදු පියාණන් වඩින මග, කොටසක් ඉල්ලාගෙන තනියම සරසන්න පටන් ගත්තේ ය. එය මඩ ගොහොරුවකි.

බුදුහාමුදුරුවන් වඩිනතුරුත් එතුමාට පාරේ වැඩ ඉවර කර ගන්නට නොහැකි විය. තමන්ගෙන් සිදු වූ අතපසු වීම පිරිමසන්නට බුදුහාමුදුරුවන්

වෙනුවෙන් ජීවිතය පරිත්‍යාග කරන්නට එතුමා තීරණය කළේ ය. තමන් පොරවාගෙන සිටි අඳුන් දිවි සම මඩ ගොඩේ එලා එතුමා ඒ මත මුනින්තලා විය. බුදුහාමුදුරුවන් ළඟට වැඩම කළ විට "ස්වාමීනී, මඩ නොපාගා මහ සඟරුවනත් සමග මගේ පිටින් වඩිනු මැනවැයි" ඉල්ලා සිටියේ ය.

බුදුරජාණන් වහන්සේ එතුමාගේ හිස අද්දර නැවතී

"පස්සථ ඉමං තාපසං
ජටිලං උග්ගතාපනං
අපරිමෙය්‍ය ඉතො කප්පෙ
බුද්ධො ලොකෙ භවිස්සති"

දැඩි තපස් ඇති ජටා දරන මේ තාපසතුමා දෙස බලන්න. මෙතුමා මෙයින් අපමණ කල්ප ගණනකට පසුව ඒකාන්තයෙන් ම බුදු වන්නේ යැයි වදාළහ. විවරණ දීම යැයි කියන්නේ එයට යි. ඒ මොහොතේ එතුමාට අවශ්‍ය නම් බුදුරජාණන් වහන්සේ වෙත පැවිදි වී රහත් වන්නට ඉඩ තිබුණි. එනමුත් මෙතරම් අපමණ සත්ත්වයන් සසර දුක් විඳිද්දී තනිව ම එතෙර වන්නේ කෙසේ ද යි සිතා බුදුවන අදහසින් සසරට එකතු වුණා.

### ක්‍රියාකාරකම 1.1

සුදුසු වචන තෝරා පහත සඳහන් වාක්‍යවල හිස්තැන් පුරවන්න.

(සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයකට, දීපංකර, දන් දී, ධ්‍යාන, අමරවතී, ශ්‍රද්ධාවක්, අඳුන් දිවිසම, පාරමිතාවෝ ය, සතර, බුදුරජාණන් වහන්සේ)

1. බෝසතාණන් වහන්සේ පළමු විවරණ ලැබුවේ .................................... නම් බුදුරජාණන් වහන්සේගෙනි.
2. සුමේධ තාපස තුමා උපන්නේ .................................... නම් නුවර ය.
3. බෝසතාණන් වහන්සේ .................................... පෙර බුදුබව පතා පෙරුම් පුරන්නට වූහ.
4. සුමේධ තාපසතුමා මඩ ගොඩේ මුනින් තලා වූයේ .................................... එලා ගෙන ය.
5. සුමේධ තාපසතුමාට සෘද්ධි බලය ලැබුණේ ....................................... වැඩීම නිසා ය.

6. දීපංකර බුදුරදුන් දැකීමෙන් තාපසතුමාට මහත් .......................................... ඇතිවිය.
7. බුදුබව පතා සසර පුරා පිරිය යුත්තේ .................................... ය.
8. සුමේධ කුමරු තමාට උරුම වූ සියලු ධනය දුගී මගී යාචකාදීන්ට .................................... පැවිද්ද සඳහා පිටත් විය.
9. තාපසතුමා තුළ මහත් ශ්‍රද්ධාවක් ඇති වූයේ "...................................." ගේ නම ඇසීමෙනි.
10. ලොව දුර්ලභ කාරණා .................................... කි.

**ක්‍රියාකාරකම 1.2**

"අනුන්ට උපකාර කිරීම බෝසත් ගුණයකි" මේ ගැන වාක්‍ය 6 ක් නිර්මාණය කරන්න.

## පුහුණුවට

බෝසත් උතුමෙකුගේ පළමු විවරණය ඉටුවීමට අංග අටක් සම්පූර්ණ විය යුතු වේ.

**මනුස්සත්තං ලිංගසම්පත්ති**
**හෙතු සත්ථාරදස්සනං**
**පබ්බජ්ජා ගුණසම්පත්ති**
**අධිකාරො ච ඡන්දතා**
**අට්ඨධම්ම සමොධානා**
**අභිනීහාරො සමිජ්ඣති.**

මිනිසත් බව ය. පුරුෂයෙකු වීම ය. රහත් වන්නට තරම් හේතු සම්පත් තිබීම ය. බුදුවරයෙකු මුණ ගැසීම ය. පැවිදිව සිටීම ය. ධ්‍යාන සමාපත්ති ගුණයෙන් යුතු වීම ය. ජීවිත පරිත්‍යාගයෙන් කළ විශිෂ්ට පූජාව ය. පෙරුම්දම් පිරීමෙහි මහත් කැමැත්ත ය. යන කරුණු අට එකතු වීමෙන් බුදු බව පිළිබඳ ප්‍රථම ප්‍රාර්ථනාව ඉෂ්ට වන්නේ ය.